


# අපේ අයගේ විත්ති

"කොත්මලේ උන්නුන සන්දිය මතක් වුණා" පන්හිඳ ලියන මෙසේ ළග සරම කැසකවා ගත්තා. සිසිරයේ සීතලෙන් කේඩෑරි කකුල් හිරිවැටුණාමයි පන්ට මතක් වුණේ තමන් ඉන්නෙ කොත්මලේ නෙවෙයි, මෙල්බර්න්වල බව.
"ඒ මොකද හිටි අඩියෙම?" පින්සල ඇහුවේ තමනුත් පන් එක්ක එක්දාස් නවසිය බර ගණන්වල කොත්මලේ රාජකාරී කරපු කාලය මතක් වෙලා වෙන්න ඇති. කොත්මලේ ජලාශයට යටවෙන පාරවල් වෙනුවට නාවලපිටියේ ඉඳන් පුන්ඩලුඔයට කපාපු පාරේ වැඩවලටය දෙන්නා හවුල් වුණේ. පාර කැපුවෙ හරංගල, රොපර්සන්ගම, කලපිටිය වාගේ රජ කාලේ ඉඳන් පැවත ගෙන ආව ගම් ප්‍රදේශ හරහා. දෙකිඳ ගම්මානයක් මේ සරු ප්‍රදේශයේ තියෙන තවත් ගමක්.
දෙකිඳ ප්‍රදේශයේ සිදුවූ සත්‍ය සිදුවීමක් ඇසුරින් ප්‍රවීණ වේදිකා නාට්‍ය අධ්‍යක්ෂකවරයකු වන ආර්.ආර්. සරම-කෝන් ශූරීන් ලියූ 'එක කුස උපන් එවුන්" නවකතාව ටෙලි සිනමාවක් ලෙසින් දැක බලා රස විඳින්නට මෙපුර රසිකයෝ වරම් ලැබූහ. එම ප්‍රදේශවලම රූගත කරන ලද සිනමා පටයේම සියලු අමුද්‍රව්‍ය සහ දායකත්වය මව්බිමෙන් ම ලැබී තිබිණ. ප්‍රවීන රංගන ශිල්පීන්ගේ ප්‍රශස්ත රංගන වින්‍යාසයක් හා මුසුවුණ නවකයින්ගේ රැඟුම් කිසිසේත්ම ඊට දෙවෙනි නොවීය. අප මව්බිම හැර ආවාට පසු එහි නිර්මාණ හෝ කුසලතා ප්‍රවාහයක් නැවතී නොමැති බව සිහිපත් කරවන මේ අගනා සෞන්දර්යාත්මක ටෙලි සිත්තමේ හරය නංවන්නට, පසුබිම් සංගීතය, ගායනා, වේෂ නිරූපන්‍ය. කලා අධක්ෂණය, කැමරාව ආදී කී නොකී සියල්ල එක හා සමානව උර දිණ. නිහාල් ප්‍රනාන්දු ගේ අධ්‍යක්ෂණයක් වූ "එක කුස උපන් එවුන්" නිෂ්පාදනය කළේ මෙන්බර්න් නුවරවාසී ප්‍රවීන රංගන ශිල්පී අජිත් සිල්වා සොහොයුරායි.
"අජිත් කියන්නේ අපිට අර කොයි දේදිත් වාගේ මුණ ගැහෙන හාදයා නේද?" පින් ඇහුවා. පිටන් පීනසේ තද වෙලා කොහේවත් යන්න කරන්න විදියක් නැතිවයි උන්නෙ. උන්දෑ නස්න කරලා, ඉසකුඩිච්චි දාලම ඔය ලෙඩේ යන්තං මඟ අරවා ගත්තා. මෙහෙ උදවියනං කියන්නේ "පොලන්" වැදිලා 'හේ ෆීවර්' කියලා. අනේ මන්දා !
"අජිත් ගොයියා හින්දා තමයි මාත් ගියේ.... හෝල් එක පිරෙන්න හිටියේ අජිත් ගේ වැඩ ගැන දන්න කියන උදවිය තමයි. පන්ගේ කතාවට පින් අන්දුන් කුන්දුන් ! පන් කිව්වේ අජිත්ගේ රඟපෑම් ගැන. ඒත් මං හිතුවෙ නෑ අජිත් ඔහොම කසිලි කාරයෙක් කියල නං."
රසිකයින් අජිත් පිළිබඳව තැබූ විශ්වාසය රැකෙනවා වෙනුවට සිදුවුනේ එය තව තවත් ඉහළ නැංවීමක්. පටු ලාභ අපේක්ෂාවකින් තොරව හුදෙක් ආත්ම තෘප්තිය සඳහාම කෙරෙන නිර්මාණයක ඇති සුන්දරත්වයයි ඒ. පසුගිය සති අන්තයක සුමියුරු ගී ප්‍රසංගයක් තුළින් ද මව්බිමේ සුවඳ ළං කරගන්නට මෙන්බර්න් රසිකයෝ වාසනා බර වූහ. විශාරද දයාරත්න රණතුංග, ආචාර්ය අමරා රණතුංග හා ශිල්පී නාරද දිසාසේකර එක්ව ගී ගැන්වුණ "තරු විසිතුරු" ප්‍රසංගයයි ඒ. එක්දහස් නවසිය හැටේ සහ හැත්තෑව දශකයන් හි රසික දනන්ගේ රසභව් පුබුදු කළ රසාලිප්ත ගී පෙළක අසිරිය ප්‍රසංග ගැන්වූයේ මෙල්බර්න් නුවර ප්‍රවීන සංගීතවේදී කැමරන් කොළඹගේ ප්‍රමුඛ "තරංගා" වාද්‍ය වෘන්දයයි.

මින් පෙර වතාවකදීද මෙම ලිපියෙන් අවධානයට ලක්වූ දරු දැරියන් තිදෙනෙකුගේ කුසලතා මුළු ප්‍රසංගය සිසාරා ස්වර අතරින් ගලා ගිය අන්දමයි එහි වූ අපූර්වත්වය. වීණා කැඳරාගම දැරිය බටනලාවෙන්ද, දිලිනි ප්‍රනාන්දු දැරිය සර පුවරු-වෙන්ද, නවීන් ගුලව්ව දරුවා වයලීනයෙන්ද නැංවූයේ එසේ මෙසේ සංගීත ඛණ්ඩ නොවේ. පණ්ඩිත් අමරදේව, ප්‍රේමසිරි කේමදාස, විශාරද ෂෙල්ටන් ප්‍රේමරත්න, විශාරද දයාරත්න රණතුංග, ශිල්පී නාරද දිසාසේකර, ශිල්පී ආර්. මුත්තුසාමි වැනි අති ප්‍රවීණයින් අතින් නිමැවුණ ස්වර ඛණ්ඩයන් ය. වෙසෙසින්ම තනි බටනලාවකින් වීණාත්, තනි වයලීනයකින් නවීන් ගුලව්ටත් ගීවල පැරණි රසයයන්ට අබැටකින් පමණින්වත් හානියක් නොකර පෑ පෙළහර නම් කදිමය. දිලිනි සුපුරුදු සේ සිය හපන්කම් පෑයේ දින දෙකක පුහුණුවකින් පමණක් ලැබූ අභ්‍යාසයෙනි. ඔවුන් පසුපසින් සිටි දැවැන්ත සෙවනැල්ලක් බඳු වූ කැමරන් කොළඹගේ වෙතින් පන්නරය ලැබුවෝය ඔවුහු. උපා උපදාස මහත්මයාගේ අදහසකට අනුව පසුගිය වසරක පැවැත්වීමට යෙදුණා වූ ශිල්පී වික්ටර් රත්නායකයන්ගේ 'ස' ප්‍රසංගයේදී දොරට වැඩි " මෙල්බර්න් පුරවර යොවුන් මියැසි කැළෙහි" දිදුලන තාරකාවෝය ඔවුහු. මේ සියලු දෑ ඉදිරිපත් කළ විනිතා සහ සුනිල් තලේරත්න යුවල ප්‍රමුඛ "සුරවි" මාසිකයේ පිරිසද මෙහිදී සිහිපත් කළ යුතුම වේ.
"ඉස්සරහටත් තව වැඩ තියෙනවා. ඒවාටත් ඉඩ තියා ගත්තොත් නේද හොඳ? පන්ගේ ලියවිල්ල දැකපු පින් කෙඳිරුවා.
"ඔව් හැබෑට" පන් ජේදය මාරු කළා.



"ලාංකේය මියැසියේ තානාපතිවරයකු වන් ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහයන්ගේ මෙන්බර්න් සංචාරය ගී හිතකාමී සැවොමගේ හිත සුව පිණිසම වනු නොඅනුමානය. සුපුරුදු පරිදි වීරසිංහයන්ගේ මෙවර දූට පිරිසට හෙතෙම ගේ ස්වර රසය මනා ලෙස උකහා ගත් විශාරද නන්දා මාලනිය සහ තමාගේ සංගීත දිවියට බොහෝ ගුරුහරුකම් ලබාගත් වික්ටර් රත්නායක ගාන්ධර්වයාණන් ප්‍රමුඛව, විශාරද දීපිකා ප්‍රියදර්ශනී, ශිල්පී සුනිල් එදිරිසිංහ, විශාරද එඩ්වඩ් ජයකොඩි, ශිල්පිනී චරිතා ප්‍රියදර්ශනී, ශිල්පී දයාන් විතාරණ, ශිල්පිනී නෙලූ අධිකාරි සහ ළමා ගායක ශිල්පී හර්ෂණ දිසානායක ඇතුළත් වේ. හෙළයේ මහා ගෙය පද රචක මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ද සහභාගි වන බවකි ඇසීමට ලැබෙන්නේ.

රෝහණ වීරසිංහ ස්වර රටාවන්ගෙන් සංගීතවත් වූයේ හෙළයේ ශිල්පී ශිල්පීන් පමණක් නොවේ. මෙරටෙහි ගී ගායනාවන් ඉදිරිපත් කරන ශිල්පීන්ටද මහත් වූ අස්-වැසිල්ලකි එම ස්වර රචනා. ප්‍රථම වතාවට මෙරට ශිල්පී, ශිල්පිනියන් දොළොස්දෙනෙකු එක්කල 'මෙ'පුර ගී" ප්‍රසංගය ඊට කදිම නිදසුනකි. එහි ගැයුණු තේමා ගීය ඇතුළුව වැඩිම තනු ප්‍රමාණයක හිමිකරුවා වූයේ වීරසිංහයන් ය.
"තව තව දේවල් තියේවී... " පින් හිස කැසුවා.
"බලමු - බලමු එතකොට ! " පන් ලියන මේසෙන් නැගිට්ටා.

SLCAA AUSTRALIA

**THE SRI LANKN CHEFS ASSOCIATION OF AUSTRALIA**
would like all Sri Lankan chefs to attend for the meeting on the 27th August 2006 at 2.30 pm at Shine Café, Bar & Lounge, No:74 - 76 Kingsway, Glen Waverly.

For the details contact
Harsha (03) 9755 6384
Nihal (03) 9705 7292
Email: slca_chefs@yahoo.com.au

TAX RETURNS
BAS & IAS
Bookkeeping
Tax Planning
Business Consultants

Sandal Financial & Tax Advisors

Amal Ramyanath
No. 47 Cypress Avenue
Glen Waverley
Vic 3150
* Special offer for Families

Phone: (03) 8802 8818
Fax: 8802 8818 Mob: 0412 775 889
Email: sandalmanagement@optusnet.com.au